**ශීර්ෂය 140 - කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 140 - කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා` වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

--------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,797.00 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,284.09 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 512.91 ක් හෙවත් සියයට 28.54 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 223.42 | 189.12 | 34.30 | 15.35 |
| මූලධන | 1,573.58 | 1,094.97 | 478.61 | 30.42 |
| එකතුව | 1,797.00 | 1,284.09 | 512.91 | 28.54 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 14001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 14.00 | 10.76 | 6.00 | 6.51 | 30.00 | 21.14 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 35.03 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0082/000 | 35.02 |
| 6000/0000/00/0013/0088/000 | 0.01 |
| එකතුව | 35.03 |

## 2.4 විගණන නිරීක්ෂණය

කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, වාහන ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ආ) ඇප ලේඛණය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි. |
| (ඇ) වාහන ලේඛණය | මුදල් රෙගුලාසි 1647 (ඉ) | යාවත්කාලීන කර නොතිබුණි |

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයන් 11 සදහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 25 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 14001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2014 ඔක්තෝබර් 30 දින සේවය අතහැර ගිය කාර්යය මණ්ඩල සහිකයකු ගෙන් අය විය යුතු රු. 107,896 ක මුදල, 2017 ජුනි 19 දින දක්වා අය කර ගැනීමට හෝ අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.4.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 09 දිනැති අංක ඩීඑම්ඒ/ඒඑම්සී/2016/05/05 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර විගණනය, සංවර්ධන කාර්යයන්ට විශේෂ අවධානය යොමුකල යුතු වුවත්, අමාත්‍යාංශය යටතේ වූ රු.මිලියන 927 ක් වටිනා ඉදිකිරීම්වලින් රු.මිලියන 147 වටිනා ඉදිකිරීම්, එනම් සියයට 16 ක් පමණක් විගණනය කර තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු නිලධාරීන් තිදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම සඳහා ගිණුම් හා විගණනය පිළිබඳ දැනුම පුහුණුව ඇති ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

**3.4.2 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) 2016 මාර්තු 8 දින රු.179,500 ක් වැය කර මිලදී ගෙන තිබූ යතුරුපැදිය 2017 මැයි 25 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තිබුණි.

(ii) 2016 සැප්තැම්බර් 30 දිනට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් රු.මිලියන 4.5 කට තක්සේරු කරන ලද වාහන 2ක් පිළිවෙලින් 2016 ජනවාරි 06 දින හා 2016 අගෝස්තු 25 දින සිට 2017 ජුලි 31 දින දක්වාම අළුත්වැඩියා කිරීමෙන් තොරව නිශ්ක්‍රීයව තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

2016 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු.මිලියන | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | |
| (i)මුදල් රෙගුලාසි 702 (3) | 850.81 | අමාත්‍යාංශය විසින් සියළුම කොන්ත්‍රාත්තු පිටපත් තුනකින් අත්සන් කර ඉන් එක් පිටපතක් විගණකාධිකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii)මුදල් රෙගුලාසි 756 සහ 757 | 173.05 | වාහන සම්බන්ධව වාර්ෂික වූ භෞතිකව සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. |
| (iii)මුදල් රෙගුලාසි. 1646 | - | අමාත්‍යාංශයේ සංචිත වාහන 9 කට අදාලව සම්පූර්ණ වර්ෂය සඳහාම ද තවත් වාහන 6ක් සඳහා මාස 5 සිට 9 දක්වා ද ධාවන සටහන් හා මාසික සාරාංශ මුල් පිටපත් විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. |

**3.6 විදේශාධාර ව්‍යාපෘති**

**විදේශාධාර ලෙස ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විදේශාධාර ගනුදෙනු ගිණුම් තැබීම පිළිබඳ 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 ඡේදයට අනුව විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් මගින් කටයුතු කල යුතුය. එසේ වුවද, 2015 දෙසැම්බර් 29 හා 2016 මාර්තු 09 යන දිනයන්හිදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් ලද එකතුව රු.3,498,900 ක් වූ මුදලක් ඍජුවම අමාත්‍යාංශයේ පොදුතැන්පත් ගිණුමෙහි තැන්පත් කර එම සම්පූර්ණ මුදලම සමාලෝචිත වර්ෂයේදී වියදම් කර තිබුණි.

**3.7 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**වැවිලි මානව සංවර්ධන භාරය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙමින් පැවති හා වර්තමානයේ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, ව්‍යාපෘති 03 ක කාර්යයන් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. ඉකුත් වර්ෂ 3ක සහ සමාලෝචිත වර්ෂය තුළදී එම ව්‍යාපෘති සඳහා වැවිලි මානව සංවර්ධන භාරයට ගෙවා ඇති මුදල රු.මිලියන 2,107.80 ක් වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** රාජ්‍ය ආයතනයක් ලෙස තහවුරු නොවූ මෙම ආයතනයට සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 850.81 ක් ගෙවා තිබුණි. ඊට අමතරව රු.මිලියන 343.13 ක් සඳහා බැරකම්වලටද බැඳී තිබුණි. ඒ අනුව ඉහත ව්‍යාපෘති තුන සඳහා සමාලෝචිත වර්ෂයේ මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන1,518.00 න් සියයට 78.6 ක් ම වැවිලි මානව සංවර්ධන භාරයට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මුදල් නිදහස් කර තිබුණි. මෙම වැවිලි මානව සංවර්ධන භාර අරමුදලට මුදල් ලබා දීමේදී අමාත්‍යාංශය හා එම භාරය අතර කිසිදු ගිවිසුමක් අමාත්‍යාංශය විසින් අත්සන් කර නොතිබුණි.

**(ආ) වැව්ලි මානව සංවර්ධන භාරය මගින් ඉටුකරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පවතින කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (අ) මාර්ගෝපදේශයට අනුව ව්‍යාපෘති කොන්ත්‍රාත්වලට අදාල සියළුම කටයුතු අධීක්ෂණය කරන බවටත් තක්සේරු කරන බවටත්, සහතිකවීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය (අමාත්‍යාංශය) වගකිව යුතු අතර නිවාස භාර ගැනීමට පෙර සපයා ඇති සේවාවල ද ඉටුකර ඇති වැඩවල ගුණාත්මක භාවයද ස්වාධීනව පරීක්ෂාකර බැලිය යුතුය. එසේ වුවද, වැව්ලි මානව සංවර්ධන භාරය මගින් ඉටුකරනු ලබන ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් වලට අදාල සියළුම කටයුතු එනම් උපදේශන සේවා සැපයීම, කොන්ත්‍රාත් කරුවන් තෝරා ගැනීම, අධීක්ෂණය, ආදී සම්බන්ධයෙන් එපරිදි සිදු නොවන බව නියැදි පරීක්ෂණ අනුව නිරීක්ෂණය විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා ප්‍රසම්පාදන මහ පෙන්වීමේ 3.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සමුපකාර සමිති වෙත එකතුව රු. මිලියන 2 කට වඩා වැඩි කොන්ත්‍රාත් නොදිය යුතු අතර නිශ්චිත කාලයක් තුල සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතුය. එසේ වුවද වැව්ලි මානව සංවර්ධන භාරය මගින් වතු සේවක නිවාස සමූපකාර සමිතිය හරහා ඉදිකිරීම් කලයුතු බවට නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩ සටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව මහපෙන්වීම් අත්වැලෙහි දක්වා තිබීමෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශණය ඉක්මවා යෑමක් නිරීක්ෂණය විය.

**(ඇ) ප්‍රතිලාභීන්ගෙන් ණය නැවත අයකර ගැනීම හා භාණ්ඩාගාරයට බැර කිරීම**

------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව මග පෙන්වීම් අත්වැලෙහි 9.2 ඡේදය අනුව ප්‍රතිලාභීන්ගෙන් ණය මුදල් ආපසු අයකිරීම ආරම්භ කළ යුතු වන්නේ වතු නිවාස ව්‍යාපෘති ආරම්භකර තෙවන මාසයේ සිටය. 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය ආරම්භය දක්වා නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 435.09 ක් හා හරිත රන් ව්‍යාපෘතිය යටතේ 2015 වර්ෂයේ දී රු.මිලියන 7.85 ක මුදලක් වැව්ලි මානව සංවර්ධන භාරය වෙත අමාත්‍යාංශය මගින් ගෙවා තිබුණි. ඉන් ණය නැවත අය කරගත යුතු ප්‍රමාණය නව ජීවන වතු නිවාස සඳහා රු.මිලියන 232.34 ක් හා හරිත රන් සඳහා රු.මිලියන 4.11 ක් වේ. 2016 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයට බැර කර ඇත්තේ රු.මිලියන 10.15 ක් හෙවත් එදිනට අයවිය යුතු ප්‍රමාණයෙන් සියයට 4.29 ක් පමණි. ඒ අනුව ණය අයකිරීමේ සාමාන්‍ය සැලකීමේදී ණය අයකිරිම නිසි අධීක්ෂණයකින් සිදු නොවීම නිසා ඉතා දුර්වල තත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(ii) ඉහත (1) ඡේදයේ සඳහන් මගපෙන්වීම් හී 9.2 ඡේදය ප්‍රකාර අයකරන ණය මුදල් මාසිකව ගෙන්වා ගෙන ඊළඟ මස 15 දිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකිරීම පිණිස සෘජුවම අමාත්‍යාංශය වෙත එවීම වතු අධිකාරීත්වයේ හා වතු සේවක නිවාස සමුපකාර සමිතියේ වගකීම වන බව දක්වා තිබුණි. එසේ වුවද 2015 සහ 2016 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 23.26 ක් හා රු.මිලියන 37.75 ක් අමාත්‍යාංශය වෙත එවා නොතිබුණි.

**(ඈ)** **ව්‍යාපෘති ක්‍රියාකාරකම් අතරමග අත්හැරදැමීම**

-----------------------------------------------

නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ 2015 දෙසැම්බර් 31 දිනට අවිච්ඡේද නිවාස 570 ක් වූ අතර ඉන් නිවාස 74 ක් නිමකර නොතිබුණි. එම නිවාස 74 න් කෑගල්ල කලාපයේ අයිලා-අයිලා නිවාස වැඩසටහන යටතේ නිවාස ඒකක 45ක් අවලංගු කර තිබූ අතර ඒ සඳහා ගෙවීම් කර නොතිබුණු බව දක්වා තිබුනත්, ඒ සඳහා රු.මිලියන 5.85 ක් ගෙවා තිබුණි. එමෙන්ම ඉතිරි නිවාස 29 සඳහා ගෙවන ලද රු.මිලියන 2.65 ක මුදල වෙනත් ව්‍යාපෘති සඳහා හිලව් කළ බවට පිළිතුරේ දක්වා ඇති නමුත් ඒ බවට තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ)** **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම හා යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් 2016 වර්ෂයේ දී ක්‍රියාකාරකම් 26 ක් සඳහා සියයට 20 ක අත්තිකාරම් ලෙස රු.මිලියන 11.88 ක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලබාදී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘති ආරම්භකිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ඊ)** **වැවිලි මානව සංවර්ධන භාරය මගින් ඉටුකරනු ලබන ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය මගින් ගෙවීම් කිරීම හා පොත් පවත්වා ගැනීම.**

-----------------------------------------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී වැවිලි මානව සංවර්ධන භාරය නමින් ලියන ලද රු.මිලියන 653 ක් වටිනා චෙක්පත් 708 ක් ආදායකයාගේ අන්‍යාන්‍යතාවය තහවුරු කර ඍජුවම ආදායකයාට ලබාදීමෙන් තොරව අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ නිලධාරීන් වෙත ලබාදී තිබුණි.

(ii) වැවිලි මානව සංවර්ධන භාරය වෙනුවෙන් සංවර්ධන අංශය මගින් ලබාගත් චෙක්පත් නැවත අදාල පාර්ශවයන් වෙත තැපැල්කිරීමේදී හා භාරදීමේදී ඔවුන්ගේ හැඳුනුම්පත් අංකය හා කෙටි අත්සන ඇතුළුව සියළු විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(iii) මාස තුනක නියැදි පරීක්ෂාවට අනුව චෙක්පත් 378 කින් 375 ක් එනම් සියයට 99 ක් සඳහා මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව, ඒවා ලද බවට වැවිලි මානව සංවර්ධන භාරයෙන් කුවිතාන්සි ලබාගෙන නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි සංග්‍රහයේ 501(ඇ) හා 502 (ආ) අනුව මහජනයාට දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් කෙරෙන කොටස් ගෙවීම් ගිණුම්ගත කිරීම හා නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීමට, ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතු කර ගැනීමට හා අදාල කාර්යයෙහි සතුටුදායක ප්‍රගතියක් අත්කර ගැනීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට අදාල සියළුම ගනුදෙනු සටහන් කර තබා ගැනීමට පොත් පත් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.8** **කාර්යසාධනය**

-----------------

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයන් ඉටුනොකර තිබුණු අතර, ඒ සම්බන්ධ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

නාය යෑම හේතුවෙන් අවතැන් වී සිටින පුද්ගලයින් සඳහා නිවාස ලබාදීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු නමුත් මාවනැල්ල, බුලත්සිංහල කුඩලිගම නාය ගිය නිවාස සඳහා 2017 ජුලි දක්වාම නිවාස ලබාදීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් නිරීක්ෂණයන්**

----------------------------

(i) නව ජීවන වතු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිම කළ යුතු නව ජීවන වතු නිවාස සංඛ්‍යාව 1354 කි. 2016 දෙසැම්බර් 31 දිනට ඔවුන් නිම කර ඇති නිවාස සංඛ්‍යාව 1126 කි. ඒ අනුව ප්‍රගතිය සියයට 83.16 ක් බව නිරීක්ෂණය විය.

(ii) හරිත රන් නිවාස වැඩසටහන (Green Gold Housing Program) යටතේ පහත පරිදි වැඩසටහන් 3 ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණි. එහි ප්‍රගතිය 2016 දෙසැම්බර් 31 දිනට පහත පරිදි විය.

| යෝජිත නිවාස ව්‍යාපෘති | යෝජිත ඉදිකිරීම් ආරම්භය හා අවසානය | 2016 දෙසැම්බර් 31 දිනට නිවාස ඉදිකිරීම් ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|
| | | ආරම්භ කල | අවසන් කල | අවසන් කිරීමට නියමිත | ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
| හරිත රන් | 2015- 2020 - නිවාස 6500 ක් | 1430 | 513 | 937 | 54.75 |
| ඉංදියන් ආධාර | 2016- 2020- නිවාස 4000ක් | 1100 | 2017 ජුලි මස වන විට නිවාස 134 ක් ආරම්භ කර ඇත. | | |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා බැංකු ඒකාබද්ධව | 2016- 2020 -4500 | 400 | ආරම්භ කර නැත. | | |

**3.9 පාඩු හා හානි**

-------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2016 අගෝස්තු 22 දින වෙන් කල වාහනයක් අනතුරකට භාජනය වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 (1) (ආ) , 104(3) හා 104(4) පරිදි කටයුතු කර නොතිබුණි. එහි අලුත්වැඩියා ඇස්තමේන්තුව රු.මිලියන 1.03 ක් වී තිබුණි. එසේම මෙම වාහනය 2017 අගෝස්තු 21 දක්වාම පෞද්ගලික ගරාජයක ඇති බව නිරීක්ෂණය විය.

**3.10 කළමනාකරණ දුර්වලතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

ස්වයං රැකියා සැපයීමේ අරමුණෙන් වතුකරයේ තරුණ තරුණියන්ට ණය ලබාදීම පිණිස චක්‍රීය අරමුදලක් ඇති කිරීම සඳහා රාජ්‍ය බැංකුවක රුපියල් මිලියනයක් තැන්පත් කිරීමට 2000 අගෝස්තු 24 දින පැවැති අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බැංකුව හා අමාත්‍යාංශය අතර ඇති කර ගත් ගිවිසුමට අනුව ණය ලබාදීම බැංකුවේ නීති රීති වලට අනුව ඇප සහිතව ලබාදිය යුතුය. මෙම අරමුදල ආරම්භ කල දින සිට 2010 වර්ෂය දක්වා ලබාදුන් මුළු ණය මුදල රු.මිලියන 9.21 කි. 2013 ජනවාරි 30 දිනට අයකරගෙන ඇති මුදල රු.මිලියන 4.22 කි. එනම් ලබාදුන් ණය මුදලින් සියයට 46 කි. ඒ අනුව ණය මුදල් අය කරගැනිම සම්බන්ධව බැංකුව ගත් උත්සහය ප්‍රමාණවත් නොවන බව හා අදාල අමාත්‍යාංශය නිසි අධීක්ෂණයක් නොකළ බව නිරීක්ෂණය විය.

(ii)දෙවන අදියර යටතේ 2016 ජනවාරි 26 දින එදිනට පැවති ශේෂය වන රු.8,758,443 ක් සඳහා ලංකා බැංකුව සමග නව ගිවිසුමක් අත්සන් කර තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් සඳහා ලබාදුන් ණය අය කිරීම නිසි පරිදි අධීක්ෂණය කිරීමට හැකි පරිදි මුදල් රෙගුලාසි 501 (ඇ) හා 502 (ආ) අනුව කටයුතු කර නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 13 | 03 | |
| (ii) | ප්‍රාථමික මට්ටම | 24 | 19 | 05 | |
| (iii) | ද්විතියික මට්ටම | 294 | 209 | 85 | |
| (iv) | තෘතීක මට්ටම | 04 | 01 | 03 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | | 01 | - | 01 |
| | | ---------- | ----------- | ----------- | ---------- |
| | එකතුව | 338 | 243 | 96 | 01 |
| | | ====== | ====== | ====== | ======= |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.
ඉහත පුරප්පාඩු පවතින තනතුරු අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු දෙකෙහි ඇතුළත් අධ්‍යක්ෂ ඉංජිනේරු තනතුර හා ප්‍රාථමික මට්ටමේ තනතුරු අතරින් තාක්ෂණික නිලධාරි තනතුරු 3 ක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීමත් හේතුවෙන් මෙම අමාත්‍යාංශයේ සිදුවන ඉදිකිරීම් ව්‍යාපෘතින් 2016 වර්ෂයේ අධීක්ෂණය නිසි පරිදි සිදු නොවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. තාක්ෂණික නිලධාරි තනතුරු තුනක් 2017 අගෝස්තු 15 දින කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇත.